# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023
## 2026 ජනවාරි/පෙබරවාරි
## සමාජීය විද්‍යා පීඨය
## සමාජ විද්‍යාව
## (නව නිර්දේශය)
## දකුණු ආසියාතික සමාජය
## SOCI 38214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. හිමාල කඳු පන්තිය නමැති සිරස් බාධකයත්, ඉන්දියන් සාගරය නමැති තිරස් ව්‍යාප්තියත් දකුණු ආසියාවටම ආවේණික වූ සුවිශේෂී සමාජ අනන්‍යතාවයක් නිර්මාණය කිරීම සඳහා සාමූහිකව බලපා ඇති ආකාරය විමසා බලන්න.

02. ''දකුණු ආසියාව සිය සංයුක්ත සංස්කෘතිය හරහා ප්‍රබල 'විවිධත්වය තුළ ඒකීයත්වයක්' පෙන්නුම් කරන අතරම, අභ්‍යන්තර සමාජ බෙදීම් හරහා 'ඒකීයත්වය තුළ විවිධත්වයක්' ද අත්විඳියි.'' නූතන රාජ්‍ය ගොඩනැගීමේ ක්‍රියාවලිය සහ වාර්ගික දේශපාලනය, කලාපයේ ඓතිහාසික ආගමික සහ සංස්කෘතික සහජීවනයට අභියෝග කර ඇති ආකාරය පරීක්ෂා කරමින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

03. බ්‍රාහ්මණ 'වර්ණ' රාමුව නොමැති වීම සහ බෞද්ධ සමානාත්මතා දර්ශනය පැවතීම, හින්දු සමාජයට සාපේක්ෂව සිංහල සමාජයේ කුල ධූරාවලිය සහ 'ශුද්ධ-අශුද්ධ' (Purity-Pollution) සංකල්පයේ ස්වභාවය වෙනස් කිරීමට කෙතරම් දුරට බලපා තිබේද?

04. ස්ත්‍රී මූලික අභ්‍යන්තර සහ බාහිර සංක්‍රමණ සාම්ප්‍රදායික පීතෘමූලික පවුල් ව්‍යුහය කෙරෙහි සහ ග්‍රාමීය පවුල් තුළ පවතින ශ්‍රම විභජනය කෙරෙහි ඇති කරන සමාජ විද්‍යාත්මක බලපෑම් සාකච්ඡා කරමින් ග්‍රාමීය ශ්‍රී ලංකාව යැපුම් කෘෂිකාර්මික ආර්ථිකයක සිට 'ප්‍රේෂණ මත යැපෙන' (Remittance-Depended) සමාජයක් දක්වා පරිවර්තනය වී ඇති ආකාරය සාකච්ඡා කරන්න.

05. ගනනාත් ඔබේසේකරගේ 'සිංහල බුද්ධාගම' සංකල්පය ඇසුරින්, නූතන ශ්‍රී ලංකාව තුළ පවතින ථෙරවාද බුදුදහම සහ 'ජනප්‍රිය බුද්ධාගම' අතර සබඳතාවය විවේචනාත්මකව අගයන්න.

(අ.පි.බ.)

06. දකුණු ආසියාතික ප්‍රධාන නගරවල ප්‍රධාන සමාජීය සහ ආර්ථික ව්‍යුහය ලෙස 'අවිධිමත් අංශය' ක්‍රියා කරන ආකාරය විශ්ලේෂණය කරමින් මෙම අනියම් ස්වභාවය මෙම කලාපය නූතන සංවර්ධන ඉලක්ක ඉෂ්ට කරගැනීමේදී අභියෝගයක් වන්නේ කෙසේදැයි පරීක්ෂා කරන්න.

07. සමාජ සංචලතාවය, පුළුල් වන ග්‍රාමීය-නාගරික පරතරය සහ සාම්ප්‍රදායික සමාජ ආරක්ෂණ ජාලයන් බිඳවැටීම යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් 1977 ට පෙර පැවති 'සුභසාධක රාජ්‍ය' ආකෘතියේ සිට 1977 න් පසු හඳුන්වා දුන් 'විවෘත ආර්ථික' නව ලිබරල්වාදී ආකෘතිය දක්වා ශ්‍රී ලංකාවේ සංවර්ධන උපාය මාර්ගවල සිදුවූ පරිවර්තනය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට (02) සටහන් ලියන්න.

(i) එම්. එන්. ශ්‍රීනිවාස් (M.N.Srinivas)

(ii) ශ්‍රී ලංකාවේ වැදි ප්‍රජාව

(iii) සිංහල සමාජයේ බහුවිවාහය

(iv) ඉන්දියානු බද්ධ පවුල

*******************************